# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1842/21 - 2013 දෙසැම්බර් මස 27 වැනි සිකුරාදා - 2013.12.27

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

විධාන අංක - 48

**2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත**

10(1)(ආ)(ii) වැනි වගන්තිය යටතේ විධානය

2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනතේ 10(1)(ආ)(ii) වගන්තිය මගින් පැවරී ඇති බලතල ප්‍රකාරව කටයුතු කරමින් කිසිදු කිරිපිටි ආනයනකරුවෙකු, නිෂ්පාදකයෙකු හෝ බෙදාහරින්නෙකු විසින් යම් ගුදමක්, ගබඩාවක් හා/හෝ එවන් කිසිදු ස්ථානයක් පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ ලියාපදිංචි කර නොමැති නම්, එම ගුදමේ, ගබඩාවේ හා/හෝ එවන් කිසිදු ස්ථානයක කිරිපිටි, පැකට්ටු වශයෙන් හෝ තොග වශයෙන් හෝ ගබඩා කර, රැස්කර හෝ රඳවා තබාගත නොහැකි බවට පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් මෙයින් විධානය කරනු ලැබේ.

මෙම විධානය වහාම ක්‍රියාත්මක වන පරිදි බලපැවැත්වෙනු ඇත.

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ අණ පරිදි,

රූමි මර්සූක්,
සභාපති.

2013 දෙසැම්බර් මස 20 වැනි දින,
කොළඹ දී ය.

01-377


1A - PG 1890 — 300 (2013/12) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.